# සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය

# රැකියා පුරප්පාඩු

NCGI
National Credit Guarantee Institution

සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය මෙරට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සහාය දැක්වීම සඳහා ශ්‍රී ලංකා රජය හා ප්‍රමුඛපෙළ මූල්‍ය ආයතන 13ක් එක්ව ස්ථාපිත කර ඇති රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් සහිත ආයතනයකි.මෙම ආයතනය සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ණය ඇපකර සපයන අතර, ආර්ථික වර්ධනය සහ සමෘද්ධි ප්‍රවර්ධනය කරන ශක්‍ය ව්‍යපෘතීන් සඳහා මුදල් ප්‍රවාහ මත පදනම් කරගත් ණය ලබාදීම ප්‍රවර්ධනය කරයි.

අප සොයන්නේ කැපවූ , ශක්තිමත් සන්නිවේදන කුසලතා ඇති, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පද්ධතිය පිළිබඳ මනා දැනුමක් ඇති, සවිස්තරාත්මකව අවධානය යොමු කිරීමට හැකියාව ඇති සහ ඉහළ කාර්ය සාධනයක් සහ කණ්ඩායම් සාමාජිකයින් සමග ඉලක්ක සපුරා ගැනීමේ හැකියාව ඇති පුද්ගලයන්ය.

ඔබ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වර්ධනයට බලපෑමක් ඇතිකොට වේගවත් කිරීමට හැකි අපේක්ෂකයෙක් නම්, අප හා එක්වන්න

## ප්‍රධාන සුදුසුකම්, පළපුරුද්ද සහ වගකීම

| | |
|---|---|
| **කළමනාකරු - හිමිකම්**<br>**හිමිකම් දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ ක්‍රියාකාරිත්වය ආවරණය කරමින් නියාමන අනුකූලතාවයට අනුගත වෙමින් සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය ද ඇතුළත්ව මෙහෙයුම් ක්‍රියාපටිපාටිය ඵලදායි අයුරින් කළමනාකරණය සම්බන්ධව වගකීම දරයි** | • අදාළ ක්ෂේත්‍රයක මූලික උපාධියක් හෝ පිළිගත් ආයතනයකින් ඒ හා සමාන වෘත්තීය සුදුසුකම්<br>• මූල්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක අවම වසර 4 ක පළපුරුද්ද |
| **විධායක නිලධාරී - සුරැකුම් පරිපාලන**<br>**ඇප සුරැකුම් පරිපාලන ක්‍රියා පටිපාටිය සඳහා පහසුකම් සපයමින් එයට අයත්වන මූලික ණය විශ්ලේෂණය සිදු කිරීම,ණය ආයෝජනය යාවත්කාලීන කිරීම, ණය ගැනුම්කරුවන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන සමග සම්බන්ධීකරණය කිරීම, ණය ගැනුම්කරුවන් ලියාපදිංචිය , වාර්තා පවත්වාගැනීම වාර්තාකරණය සම්බන්ධව වගකීම් දරයි** | • වාණිජ, මූල්‍ය ක්ෂේත්‍රයක මූලික උපාධියක්<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ හෝ බැංකු / මූල්‍ය අංශයේ ණය ලබා දීම සම්බන්ධ අවම වසර 2ක පළපුරුද්ද.<br>• මයික්‍රොසොෆ්ට් ඔෆිස් මෘදුකාංගය සම්බන්ධ ප්‍රවීණත්වය |
| **විධායක නිලධාරී - ප්‍රසම්පාදන හා පරිපාලන**<br>**ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සමස්ත ක්‍රියාවලිය සඳහා සහාය ලබාදීම,ප්‍රසම්පාදන අයවැය සකස් කිරීම හා සංවර්ධනය කිරීම, ප්‍රසම්පාදන අවදානම් හඳුනා ගැනීම හා අවම කිරීම**<br>**ප්‍රසම්පාදන හා පරිපාලන ක්‍රියාවලිය සුමට කිරීම** | • මූලික උපාධියක් හෝ පිළිගත් ආයතනයකින් / ආයතනවලින් ලබා ගත් ඒ හා සමාන වෘත්තීය සුදුසුකම්<br>• රාජ්‍ය ආයතනයක ඒ හා සමාන රැකියා භූමිකාවක සහතික කරන ලද ප්‍රසම්පාදන පළපුරුද්දක් පැවතීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ඇත. |

සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවීම අවසන් වන දිනට වයස අවුරුදු 57ට අඩු විය යුතුය.

### වැටුප් පැකේජ

සියලුම තනතුරු ස්ථිර හා පූර්ණකාලීන තනතුරු වන අතර ,තෝරා ගත් අයදුම්කරුවන් සඳහා ආකර්ෂණීය වැටුප් පැකේජයක් හිමිය.

### තෝරා ගැනීමේ ක්‍රමවේදය

පරිපූර්ණ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් තුළින් තෝරාගැනීම් සිදු කරනු ලබන අතර,සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් හට පමණක් එම තෝරාගනු ලබන ක්‍රියාවලි තුළ සියලු අදියරවලදී දැනුම් දෙනු ලබන බව කරුණාවෙන් සලකන්න.

මේ සම්බන්ධව ඔබ කැමැත්තක් දක්වන්නේ නම්, හා අදාළ අවශ්‍යතා සපුරාලිය හැකි නම්, කරුණාකර ඔබගේ සම්පූර්ණ ජීවදත්ත , PDF ආකෘතියෙන් ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ ඊමේල් ලිපි සමග මෙම දැන්වීම් පළවී දින 7 ඇතුළත info@ncgil.lk වෙත යොමු කරන්න.

**සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය,**
**මහ ලේකම් කාර්යාලය,**
**321,3 වන මහල, ලෝටස් පාර, කොළඹ 01**

**www.ncgil.lk**